**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #March18**

පුවත්පතක පළ වන්නාවූ ලිපියක අන්තර්ගත තොරතුරු සනාථ කරන්නා වූ මූලාශ්‍රයන් සඳහන් කිරීමේ වැදගත් කම අප විසින් මින් පෙරද නැවත නැවතත් සඳහන් කර ඇත්තෙමු. මෙසේ නිවැරදි මූලාශ්‍රයන් සඳහන් කිරීම මගින් වෙනත් පාර්ශවයන්ට එම ලිපියට අභියෝග කිරීමේ හැකියාවද අවම වේ. උදාහරණයක් ලෙසින් මෙම ලිපිය දැක්විය හැක. මෙහි අල් ජසීරා නාලිකාව වහාබි වාදයට සහාය දක්වන්නේ යැයි ඍජු චෝදනාවක් නඟා ඇත. එවැනි චෝදනාවක් නැඟීම සඳහා අදාළ මාධ්‍යවේදියා විසින් පදනම් කොටගත් මූලාශ්‍ර තිබේද? ඒවා මොනවාද? එවැනි වැඩසටහන් විකාශය වූ දිනයන් හෝ ප්‍රවෘත්තිය තුළ සඳහන් කිරීමට හැකි නම් ඉහත අප නැගූ පැනයන් නැගීම සඳහා පාඨකයාට අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

පුවත්පතක නිරවද්‍යතාවයෙන් හීන කරුණු සඳහන් වීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව අවසානයට සිහිපත් කරමු.